# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2392/14 – 2024 ජූලි 08 වැනි සඳුදා – 2024.07.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/03.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.12.04 දිනැති හා අංක 2361/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. පාදුක්ක, දම්පිටියාව පාර, අංක 14 හි පදිංචි ජී.සී.ජයලත් මහා 2. දෙහිවල, පැපිලියාන පාර, අංක 52/38ඒ හි පදිංචි එල්.ඒ.ජේ.සිල්වා මයා, 3. දෙහිවල, ප්‍රතිබිම්බාරාම පාර, 79/51 හි පදිංචි පී.ආර්.එල්.පීරිස් මයා. 4. නුගේගොඩ, පැපිලියාන පාර, 32/ඒ හි පදිංචි ජී. එෆ්. ෆොන්සේකා මයා, 5. රාජගිරිය, යූ.ඊ.පෙරේරා මාවත, 88/4 හි පදිංචි ජී. එස්. අබේවික්‍රම මයා, සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, විත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 85/2023 හා 2024.05.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ.ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.

මගේ අංකය - IR/COM/03/2019/03.
නඩු අංකය: A/85/2023

**පෙනී සිටීම**

*පළමු පාර්ශ්වය වෙනුවෙන්*

01. නියෝජිත එම්.එම්.පී. මුතුආරච්චි මහතා
02. පී. සී. ජයලත් මහතා
03. එල්. ඒ. ජේ. සිල්වා මහතා
04. පී. ආර්. එල්. පිරිස් මහතා
05. පී. එෆ්. ෆෝන්සේකා මහතා
06. පී. එස්. අබේවික්‍රම මහතා

01. පී. සී. ජයලත් මයා, අංක 14, දම්පිටියාව පාර, පාදුක්ක
02. එල්. ඒ. ජේ. සිල්වා මයා, 52/38ඒ, පැපිලියාන පාර, දෙහිවල
03. පී. ආර්. එල්. පිරිස් මයා, 79/51, ප්‍රතිබිම්බාරාම පාර, දෙහිවල
04. පී. එෆ්. ෆෝන්සේකා මයා, 32/ඒ, පැපිලියාන පාර, නුගේගොඩ
05. පී. එස්. අබේවික්‍රම මයා, 88/4, යූ. ඊ. පෙරේරා මාවත, රාජගිරිය

*පළමු පාර්ශ්වය*

සහ

*දෙවන පාර්ශ්වය වෙනුවෙන්*

01. නීතිඥ දිමිත්‍රී පඩිවිට මහත්මිය
02. නිති නිලධාරි නදිකා ගාර්දිවසම් මහත්මිය
03. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි පී. ඒ. පී. පී. කේ. පෙරේරා මහතා
04. මානව සම්පත් කළමනාකාර උත්පලා සෙනවිරත්න මිය
05. මානව සම්පත් නිලධාරි එස්. ඒ. එම්. සිරිවර්ධන මිය

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02

*දෙවන පාර්ශ්වය*

අතර පවතින ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වු ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් නිතිඥ බි. කේ. ප්‍රභාත් චන්ද්‍රකිර්ති මහතාගේ 2023.11.09 හා අංක IR/COM/03/2019/03 අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කර ඇති පී. සී. ජයලත් මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයන් 05 දෙනා හට උසස් වීම් ලබාදීමේ දී අසාධාරණයක් සිදුවී තිබේද? අසාධාරණයක් සිදු වී ඇත්නම් එම එක් එක් සේවකයාට හිමි යුතු සහන කවරේද ? යන්න පිළිබඳ වේ.

01. පි. සි. ජයලත් මහතා
02. එල්. ඒ. ජේ. සිල්වා මහතා
03. පි. ආර්. ඒල්. පිරිස් මහතා
04. පි. එෆ්. ෆෝන්සේකා මහතා
05. පි. එස්. අබේවික්‍රම මහතා

නඩු විභාගයන් පැවැත් වූ දිනයන්

2023.12.19
2024.01.04
2024.01.17
2024.01.26
2024.01.30
2024.02.06
2024.02.13
2024.02.20
2024.02.27
2024.03.06
2024.03.13
2024.03.21
2024.04.06
2024.04.08

බේරුම්කරණ විභාගය හා එය පැවැත්වූ ආකාරය

2024.01.26 වන දින කාර්මික අධිකරණයේ සාක්ෂි දෙමින් දෙවන පාර්ශ්වයේ නීතිඥ දිමිත්‍රී පඩිවිට මහත්මිය මෙසේ ප්‍රකාශ කර සිටි. "දෙවන පාර්ශ්වය මේ සම්බන්ධයෙන් සමථයකට සුදානම් නමුත් උසස් කිරීම් ඇතුලත් ලැයිස්තු කිහිපයක් තිබෙන අතර එම ලැයිස්තු වලින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සහිත එක් ලැයිස්තුවක් මත පිහිටුවා ඔවුනට හිඟ වැටුප් ලබාදීමට දෙවන පාර්ශ්වය එකඟ වී තිබෙනවා නමුත් පි. ආර්. එල්. පී. පීරිස් මහතා ඔහුගේ තනතුරු ප්‍රතික්ෂේප කිරීම සමග අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයකට එළඹ තිබෙනවා. මෙම ඉල්ලුම්කරු වෙනුවෙන් බි. සි. පෙරේරා, කමිටු වාර්තාව ක්‍රියාත්මක කිරීමට සුදානම් නැති බව එම අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට විරුද්ධව ඔහු යම්කිසි අධිකරණයකට ගොස් එම තීරණය අවලංගු කිරීමට කටයුතු කර නැහැ. එම හේතුවෙන් එම ලැයිස්තුව මත අනෙකුත් ඉල්ලුම්කරුවනට හිමි හිඟ මුදල් ලබාදීමට දෙවන පාර්ශ්වය එකඟ වෙනවා.

කාර්මික අධිකරණය - 2024.01.26 පිටු අංක 356 - 360

ප්‍ර - 3 වන ඉල්ලුම්කරු වන පි. ආර්. එල්. පීරිස් මහතා ලංකා විදුලිබල මණ්ඩලය පවසන පරිදි අතිකාල මත ලබන වාසි පදනම් කරගෙන තමාට ලද තනතුර ප්‍රතික්ෂේප කල බවයි. එහෙත් ඔහු විසින් දැන් මෙය ඉල්ලා සිටින නිසා සමස්ථයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ හැකි ද ?

පි - එසේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කුමක් වෙයිද දන්නේ නැහැ.

ප්‍ර - විශ්‍රාම ගිය කිසිම සේවකයෙකුට බි. සි. පෙරේරා වාර්තාව ක්‍රියාත්මක වෙලා නැද්ද ?

පි - ඒ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් කරන්න අපහසුයි. කෙසේ වෙතත් මේ මහතා සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් තිබෙන නිසා එය අභිබවා කටයුතු කිරීමට නොහැකියි.

ප්‍ර - අධ්‍යක්ෂක මණ්ඩල තීරණය තිබෙනවාද?

පි - ඔව් (සාක්ෂිකරු විසින් එය ඉදිරිපත් කර සිටියි)

මෙම ලේඛනය R35 ලෙස දැනටමත් සලකුණු කර ඇත.

2024.01.30 වන දින පැවති කාර්මික අධිකරණ නඩු විභාගයේ දී අධිකරණයේ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් දෙවන පාර්ශ්වයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) පී.වී.ජේ. පෙරේරා මහතා

ප්‍ර - අදාළ ඉල්ලීම කරලා තිබෙන්නේ නොවැලැක්විය හැකි හේතුවක් නිසා වසරකින් කල් දාන්න කියලා නේද?

පි - කල් දමන ලෙස

ප්‍ර - මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවාද ? පිළිගන්නවාද කියලා දෙවන පාර්ශ්වයෙන් පීරිස් මහතාට ලිපියක් ලබාදී නැහැ.

පි - ලිපියක් යවලා නැහැ. (පිටු අංකය 374) මේ පිළිබඳව පැ.5 ලේඛනය අනුව පෙනී යන්නේ 2009.11.06 වන දින නොවැළැක්විය හැකි පෞද්ගලික හේතූන් නිසා පත්වීම භාර ගැනීමට ඉඩ දී ඇති කාල සීමාව එක් වර්ෂයකින් දීර්ඝ කරන ලෙසටයි. ඔහු එම ඉල්ලීම කරන විට බොරලැස්ගමුව පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේ විදුලි අධිකාරී වශයෙන් සේවය කර ඇත. මෙම ලිපිය ලංකා විදුලිබල මණ්ඩලයේ රත්මලාන විදුලි ඉංජිනේරු මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික) කලාප 04 වෙත 2009.11.06 යොමු කර ඇති බව පෙනී යයි.

මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් 2024.01.30 වන දින කාර්මික අධිකරණයේ දී කරන ලද ප්‍රශ්න කිරීම් පහත දක්වමි.

ප්‍ර - මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවාද? පිළිගන්නවාද කියලා දෙවන පාර්ශ්වයෙන් ලිපියක් ලබාදී නැහැ.

පි - ලිපියක් යවලා නැහැ.
අධිකරණය

ප්‍ර - ඒ අවස්ථාවේ අනුප්‍රාප්තිකයෙකු නැහැ දැනුම් දීලා තියෙනවාද?

පි - පිළිතුරක් ලබා දුන්නේ නැත. (පිටු අංක 374)

**සාක්ෂි විශ්ලේෂණය හා නිගමනයන්**

මේ අනුව පෙනී යන්නේ අතිකාල ලබාගැනීමේ පරමාර්ථයෙන් උසස්වීම් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම නොව ඊට අදාළ අනෙකුත් කටයුතුවල ප්‍රමාද දෝෂයන් බව නිරීක්ෂණය වේ. මේ අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය එළඹි නිගමනය පදනම් විරහිත බවට ප්‍රකාශ කර නිගමනය කර තීරණය කරමි. එබැවින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( පිරිස්) ගේ 2008.08.12 දිනැති නාම ලේඛනයේ 127 වෙනි ස්ථානයේ පීරිස් මහතාගේ නම් ඇතුලත් වී ඇති බැවින් ඔහුට ද මෙම උසස්වීම් හිමි වන බව තහවුරු වේ. ඒ අනුව අදාළ උසස්වීම පීරිස් මහතාට ලබාදිය යුතු බවට නිගමනය කර තීරණය කරමි. පි. ආර්. ඒ. පීරිස් මහතා ඇතුළු ඉල්ලුම්කරුවන්ට උසස්වීම් ලබාදිය යුතු ආකාරය පහත සටහනක් මගින් ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් මෙම අධිකරණයේ දී ලකුණු කරන ලදA10 ලේඛනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පීරිස්) ගේ අංක ඩී. පි. එම්. (පි)එච්. ආර්. ඕ. (පි. එෆ්) බී. සි. පෙරේරා/ උසස්වීම හා 2008 අගෝස්තු 12 ලිපියට අමුණා ඇති ඇමුණුම් 1 සඳහන් පරිදි කල්පිත පදනමක් මත උසස්වීම් ලබාදිය යුතු ලැයිස්තුවක් නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇත. මේ අනුව පිළියෙල කරන ලද උසස්වීම් හා ගෙවිය යුතු හිඟ වැටුප් හා දීමනා පිළිබඳ ලේඛනය පහතින් දක්වා ඇත. ඒ අනුව අදාළ ඉල්ලුම්කරුවන්ට උසස්වීම් ලබාදීමටත් ඔවුන්ගේ නම් ඉදිරියෙන් ඇති ගෙවිය යුතු හිඟ වැටප් හා දීමනා ගෙවීම නිත්‍යානුකූල හා සාධාරණ බැවින් මෙම ඉල්ලුම්කරුවන් 05 දෙනාට අදාළ පෙරදානම් කර උසස්වීම් ලබාදීමට ලංකා විදුලි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වෙත මෙයින් නියම කර නියෝග කරයි. (පිටු අංකය 1101,1102)

ලංකා විදුලි බල මණ්ඩලයේ වාර්තා පරිදි (පිටු අංක 439-688-689)

| *ඉල්ලුම්කරුගේ නම* | *සේ.අ.අ* | *තනතුර* | *උසස්වීම් ලබාදුන් දිනය* | *උසස්වීම් ලබාදිය යුතු දිනය* | *ගෙවිය යුතු හිඟ වැටුප් හා දීමනා* |
|---|---|---|---|---|---|
| පි. සි. ජයලත් මහතා | 10415 | විදුලි අධිකාරි I<br>ඉංජි. සහකාර<br>ජ්‍යෙෂ්ඨ ඉංජි. සහකාර | 1988.01.01<br>2002.09.01<br>ලබාදී නැත. | 1988.01.01<br>1995.01.01<br>2000.01.01 | රු. 231255.00 |
| එල්. ඒ. ජේ. සිල්වා | 9637 | විදුලි අධිකාරි II අ<br>විදුලි අධිකාරි I<br>ඉංජි. සහකාර I<br>ජ්‍යෙෂ්ඨ ඉංජි. සහකාර | 1981.06.15<br>1996.01.01<br>2002.09.11<br>2009.02.26 | 1981.01.01<br>1987.01.01<br>1999.01.01<br>2004.01.01 | රු. 179655.86 |
| පි.ආර්. එල්. පීරිස් මහතා | 8145 | විදුලි අධිකාරි I<br>ඉංජි. සහකාර<br>ජ්‍යෙෂ්ඨ ඉංජි. සහකාර | 1992.01.01<br>2011.10.18<br>ලබාදී නැත. | 1987.01.01<br>1997.01.01<br>2002.01.01 | රු. 710233.35 |
| පි. එෆ්. ෆෝන්සේකා මහතා | 8159 | විදුලි අධිකාරි I<br>ඉංජි. සහකාර<br>ජ්‍යෙෂ්ඨ ඉංජි. සහකාර | 1992.01.01<br>2002.09.11<br>ලබාදී නැත. | 1987.01.01<br>1997.01.01<br>2002.01.01 | රු.511563.00 |
| පි. එස්. අබේවික්‍රම මහතා | 3068 | විදුලි අධිකාරි I<br>ඉංජි. සහකාර<br>ජ්‍යෙෂ්ඨ ඉංජි. සහකාර | 2002.09.11<br>2006.09.11<br>ලබාදී නැත. | 1987.01.01<br>1998.01.01<br>2003.01.01 | රු.401008.00 |
| | | | | එකතුව | රු.20.33715.21<br>(රු.විසි ලක්ෂ<br>තිස්තුන්දහස්<br>හත්සිය<br>පහලවයි ශත<br>විසි එකයි) |

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි විසින් නිකුත් කරන ලද ඔහුගේ චක්‍රලේඛ අංක 2003/G M27 ප්‍රතිපත්ති හා මාගේ අංක නි.අ.අ. (ප්‍රතිපත්ති) මාසක/පි/පි එස් 1 (89) (ටි) හා 2003 ජූලි 18 චක්‍රලේඛනය මගින් බි.සි. පෙරේරා කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම යටතේ 1981.01.01 දින සිට කල්පිත උසස්වීම් සිදු කළ යුතු ආකාරය පැහැදිලි කර ඇත. (පිටු අංක 017)

**ප්‍රදානය අදාළ කිරීම**

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි විසින් නිකුත් කළ එල්බි/එච්ආර්බි/(ඊ) 138.IV හා 2003.12.24 ලිපියෙන් සියලුම ශාඛා ප්‍රධානින් හා ගෙවීම් ඒකක ප්‍රධානින් වෙත දන්වා ඇත්තේ විධායක තනතුරු දරමින් සිටි අවධියේ ගෙවීම් කරන ලද අතිකාල මුදල් පෙරදාතම් කරන විධායක තනතුරු සඳහා ගෙවන හිඟ වැටුපෙන් අය නොකළ යුතු බවයි.

මේ අනුව ලබාන්නා ලද අතිකාල මුදල් පිළිබඳව ගැටලුවක් ඇති නොවේ. (පිටු අංක 323)

එමෙන් ම ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයෙන් 6.2 යටතේ මෙම ඉල්ලුම්කරුවන් විශ්‍රාම ගොස් සිටියදී අදාළ උසස්වීම් ලබාදීමට එය බාධාවක් නොවන බව සඳහන් කර ඇත. ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් මෙම ඉල්ලුම්කරුවන් 05 දෙනා විශ්‍රාම ගොස් අවුරුදු ගණනාවකට පසුව කළ ඉල්ලීමක් බැවින් එය සැලකිල්ලට ගෙන මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙසට දෙවන පාර්ශ්වය කරනු ලබන ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

තවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) විසින් සියලුම විදුලි අධිකාරිවරුන්ගේ උසස්වීම් සකස්විය යුතු ක්‍රමවේදයට අදාළ විය යුතු චක්‍රලේඛයට අනුකූල වන අන්දමින් සකස් කළ නාම ලේඛනය 2008.08.12 දාතමින් මාගේ අංක ඩී.පී.එම්/පි/එච්/ආර්/ඕ (පිඑෆ්) බී.සී. පෙරේරා උසස්වීම් යටතේ ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ආවරණ ලිපියක් සහිතව යොමු කර ඇති බව පළමු පාර්ශ්වය විසින් මෙම අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කර ඇත. තවද මෙම ලේඛනය අනුව පහත නම් සඳහන් නිලධාරීන්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් උසස්වීම් ලබාදී ක්‍රියාත්මක කළ බවද සඳහන් කර ඇත. (පිටු අංක 1038, 1039, 1040, 1042, 1043,)

| නම | සේ.අ.අ | ලේඛන අංකය |
|---|---|---|
| ඩබ්ලිව්. අයි. ඊ. අප්පුහාමි මහතා | 397 | 5 |
| ඒ. ඒ. පි. අබේසිංහ මහතා | 49 | 8 |
| ආර්. බි. බණ්ඩාරනායක මහතා | 1995 | 15 |
| එස්. එල්. පි. ප්‍රනාන්දු මහතා | 1419 | 15 |
| ආර්. ඒ. එම්. සෝමසිරි මහතා | 2842 | 25 |
| කේ. ජේ. ලයනල් මහතා | 5183 | 104 |

මේ අනුව මගේ ප්‍රදානයට එයද පූර්වාදර්ශයක් ලෙස සැලකිල්ලට ගත් බව සඳහන් කරමි. මේ අනුව පෙනී යන්නේ මෙම ඉල්ලුම්කරුවන් 05 දෙනා පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයෙන් සාධාරණයක් සිදු වී නොමැති බව සඳහන් කරමි. එබැවින් සාධාරණ තීරණයක් වශයෙන් ඉහත සඳහන් චක්‍රලේඛනයන්ට අනුව ඉල්ලුම්කරුවන් 05 දෙනාම පෙරදාතම් කරමින් උසස්විම ලබාදීම සාධාරණ හා නිවැරදි තීරණයක් බවද සඳහන් කරමි.

**නිගමන හා නිර්දේශ**

සියලුම උසස්වීම් සඳහා පුරප්පාඩු සීමාවන් ඉවත් කර ඇති බව ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති විසින් ඔහුගේ CEB / (CH) Unions) හා 29.03.2003 ලිපියෙන් හා කමිටු නියෝජිතයන් තිදෙනකුගේ අත්සන් සහිතව 2003.03.27 සියළුම වෘත්තිය සමිති වෙත ලිපියක් මගින් දන්වා ඇත. (පැ. 03) තවද පුරප්පාඩු සැලකිල්ලට නොගෙන උසස් වීම් ලබාදී ඇති බව පළමු පාර්ශ්වයේ ඇමුණුම් 01 අනුව පැහැදිලි වේ. (පිටු අංක 1022)

**ප්‍රදානය**

ඒ අනුව යුක්ති සහගත හා සාධාරණ තීරණයක් වශයෙන් පහතින් නම් සඳහන් කළ ඉල්ලුම්කරුවන් වන

01. පි. සි. ජයලත් මහතා
02. එල්. ඒ. ජේ. සිල්වා මහතා
03. පි. ආර්. එල්. පිරිස් මහතා
04. පි. එෆ්. ෆොන්සේකා මහතා
05. පි. එස්. අබේවික්‍රම මහතා

ඔවුන් උසස්වීම් පෙරදාතම් කිරීමට ඉල්ලා සිටි දින අනුව අදාළ උසස්වීම් පෙරදාතම් කර ලබාදීමටත් ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් ගණනය කර මෙම කාර්මික අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති හිඟ මුදල් ඔවුන්ට ගෙවීම් පිළිබඳව අවශ්‍ය කටයුතු සඳහා අදාළ හිඟ මුදල වන රු. විසිලක්ෂ තිස්තුන්දහස් හත්සීය පහලවයි ශත විසි එකක මුදල (රු.2033715.21) මෙම ප්‍රදානය ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ වී මසක් ඇතුලත සහකාර කොමසාරිස් (දකුණු කොළඹ) කම්කරු කාර්යාලයේ තැන්පත් කිරීමටත් එසේ කළ බවට මෙම බේරුම්කරණය හා කාර්මික අධිකරණය වෙත දැනුම් දීමටත් කටයුතු කරන ලෙසට නියෝග කර නියම කරමි. මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවටද මම සහතික කරමි.

**ඒ. බී. හේරත්,**
බේරුම්කරු.

2024 මැයි මස 17 වැනි දින,
බේරුම්කරණය හා කාර්මික අධිකරණයේ දීය.

EOG 07 - 0065

මගේ අංකය: IR/COM/03/2022/83.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.06.13 දිනැති හා අංක 2336/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.06.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බුලත්සිංහල, ... වශයෙන් බූස්ස, මහහැගොඩ, හදනගොඩ හි පදිංචි ඩී. එච්. ටී. සෙනරත් මහතා සහ කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/45/2023 හා 2024.05.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

## බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

ආරාවුල් අංකය: IR/COM/03/2022/83
බේරුම්කරණ අංකය: A/45/2023

ඩී. එච්. ටී. සෙනරත් මයා,
හඳනගොඩ,
මහ හැගොඩ,
බූස්ස.

*පළමු පාර්ශ්වය*

*සහ*

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
නො 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

පෙනී සිටීම
පළමු පාර්ශ්වය වෙනුවෙන් : නීතිඥ A. P. J. K. A. අමරසිංහ මයා.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් : වීනාශ්වරී ජයතිලක මහත්මිය සමග නීතිඥ ශානිකා ගාල්ලගේ මහත්මිය.

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2023.06.06 වැනි දින බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

''ඉහත සඳහන් පාර්ශ්වයන් අතර කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ඩී. එච්. ටී. සෙනරත් මහතාට 2020.02.13 දින වැඩ තහනම් කරමින් ලබාදී ඇති විනය දඬුවම් (අත්හිටුවූ කාලයට හිඟ වැටුප්, අනෙකුත් දීමනා සියල්ල වර්ෂ අවසානයේ ලබාදෙන බෝනස් දීමනා, අර්ථ සාධක අරමුදල් හා වෙනත් සහනයන් ලබා නොදීම) මගින් අසාධාරණයක් සිදුව තිබේද, යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

පැමිණිලිකාර පළමු පාර්ශ්වය ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ගාල්ල ඩිපෝවට අනුයුක්ත කොන්දොස්තර වරයෙකි. පැමිණිලිකරු 2019.10.23 දින අංක NA 5194 බස් රථයේ සේවය කරමින් සිටි අතර එම බස් රථය ගාල්ල සිට සිරිකඳුරවත්ත දක්වා ධාවනය කරමින් තිබියදී ජංගම පරීක්ෂණ නිලධාරීන් බස්රථයට ගොඩ වී පරීක්ෂා කර ඇත. එම පරීක්ෂාවේ දී කොන්දොස්තර මහතා අතින් සිදු වී ඇති වැරදි කිහිපයක් අනාවරණය වී ඇත. ඒ අනුව චෝදනා අටක් සහිත චෝදනා පත්‍රයක් පැමිණිලිකරුට එරෙහිව නිකුත් කර ඇත. එම වැරදි මත පැමිණිලිකරුගේ සේවය අත්හිටුවා විනය පරීක්ෂණයක් සිදුකර ඇති අතර එමගින් අදාළ චෝදනා සියල්ලටම වැරදිකරු කරමින් දඬුවම් නියම කර ඇත. එම තීරණයට එරෙහිව කරන ලද අභියාචනය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයේදී ද එම තීන්දුවම ලබාදී ඇත.

ඒ අනුව පැමිණිලිකරුට ''සේවා තහනම් කාලයේදී නොගෙවන ලද වේතනය අහිමි කරමින්

1. ඉදිරියට මාස හයක් සේවය තාවකාලිකව අත්හිටුවීම
2. මෙවැනි විෂමාචාරවලින් වැළකී සේවය කරන ලෙසට අවවාද කිරීම " යන දඬුවම් නියම කර ඇත.

පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ ඉල්ලීම වන්නේ දෙවන පාර්ශ්වය විසින් විනය ව්‍යවස්ථා මාලාවට පටහැනිව අසාධාරණ හා අයුක්ති සහගත අයුරින් ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා විනය නියෝග නිකුත් කර ඇති බවයි. පැහැදිලි සාක්ෂි නොමැතිව, පෞද්ගලික අමනාපකම් මත අභූත සහ අසත්‍ය චෝදනා නගමින් චෝදනා ඔප්පු නොකර වැරදිකරු ලෙස තීරණය කර දඬුවම් නියම කර ඇති බවය. ඒ අනුව පැමිණිලිකරු,

1. 2020.02.13 දින සිට 2020.07.20 දින දක්වා වැටුප් ද
2. 2020.11.15 දින සිට 2021.05.14 දින දක්වා වැටුප් ද
3. 2020.02.13 දින සිට 2021.05.14 දින දක්වා දීමනා, බෝනස් දීමනා, අර්ථ සාධක අරමුදල් සහ වෙනත් සහන ලබා දෙන ලෙස අයැද සිටී.

මෙම විභාගයේදී 1 පාර්ශ්වය වෙනුවෙන් එක් සාක්ෂියක් හා 2 පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දෙකක් ලබා දෙන ලදී.

**1 පාර්ශ්වය වෙනුවෙන් ලබා දෙන ලද සාක්ෂිය**

1 පාර්ශ්වය වෙනුවෙන් පැමිණිලිකරු විසින් සාක්ෂි දෙන ලදී.

පැමිණිලිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලද්දේ තමා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු කොන්දොස්තර වරයෙකු බවයි. තමා 2019.10.23 දින ගාල්ල ඩිපෝවට අයත් අංක NA 5194 බස් රථයේ සේවය කරමින් සිටියදී ජංගම පරීක්ෂක මහතුන් රත්ගම හන්දියේදී බස් රථයට නැග ටිකට් චෙක් කරන්නට පටන් ගත් බවයි. තමා විසින් බස් රථයට නැගපු සියලුම මගීන්ට ටිකට් නිකුත් කර තිබිනි. ජංගම පරීක්ෂක මහතුන් විසින් ළමයෙක් ලඟ තිබූ ටිකට් 23ක් ඔවුන්ගේ භාරයට අරගත්තා. පරීක්ෂණ කටයුතු එතැනින් අවසන් කළා. ඉන් පසුව අඩු දඬුවමක් ලබා දීම සඳහා ළමයින්ගෙන් ටිකට් දෙකක් ලබා ගත් බව පිළිගෙන ප්‍රකාශයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. එහෙත් මම කිසි වරදක් නොකළ බවත් මේ ඔක්කොම බොරු බවත් ලියා දුන්නා. ජංගම පරීක්ෂක මහතුන් මේ අවස්ථාවේදී

දුරකථන ඇමතුමක් මගින් යම් කෙනෙකුගෙන් උපදෙස් ලබාගෙන මෙයාට ප්‍රවේශ පත්‍ර විෂමාචාරය ගැන ලියන්නම ඕනෑ කියලා කිව්වා. ඒ දුරකථන ඇමතුම මට ඇහුනා. පසුව ඩිපෝවේදි කටඋත්තර ලබාගෙන මගේ සේවය තහනම් කළා. කිසිදු පරීක්ෂණයක් කළේ නැහැ. පසුව චෝදනා පත්‍රයක් ලබා දී විනය පරීක්ෂණයක් කළා. චෝදනා පත්‍රයේ චෝදනා අටක් තිබුණා. විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබාදුන් අයගෙන් ප්‍රශ්න කරන්නට අවස්ථාවක් දුන්නේ නැහැ. මගේ නියොජිතයා ප්‍රශ්න ඇසුවේ නැහැ. නියෝජිත මහත්තයා මට උපදෙස් දුන්නේ කථා නොකර ඉන්න කියලයි. මට ප්‍රකාශයක් කරන්න අවස්ථාවක් දුන්නේ නැහැ. විනය පරීක්ෂණයට අදාළ කඩදාසිවලට අත්සන් කරන්න කීව්වා. ඒ තැන්වල මමත් මගේ නියෝජිත මහතාත් අත්සන් කළා. විනය පරීක්ෂණයෙන් චෝදනා අටටම වැරදිකරු බව තීරණය කර ඒ බව මට දැනුම් දුන්නා. මගේ නිදහසට කරුණු දැක්වීම සඳහා හෝ ප්‍රකාශයක් කිරීමට අවස්ථාවක් ලබා නොදුන් නිසා එම විනය පරීක්ෂණය අසාධාරණ එකක්. ඒ අනුව මම අභියාචනයක් ඉදිරිපත් කළා. අභියාචනා පරීක්ෂණය නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේදී සිදු කළා. අභියාචනා පරීක්ෂණය සඳහා මගේ නියෝජිතයා ලෙස කටයුතු කළේ මගේ විනය පරීක්ෂණයට පෙනී සිටි නියෝජිත මහතාමයි. අභියාචනා පරීක්ෂණයේ දී කිසිදු ආකාරයක විභාගයක් කළේ නැහැ. මගෙන් සහ මගේ නියෝජිත මහතාගේ අත්සන් ලබාගැනීම පමණයි සිදුකළේ. අභියාචනා විභාගයේ තීන්දුව වුයේ පරීක්ෂණයෙන් ලබාදුන් තීන්දුවමයි. මම මේ චෝදනාවල සඳහන් වරද වලින් එක වරදක් පමණක් (එනම් චෝදනා අංක 6 - ඒකාබද්ධ මගී ප්‍රකාශණ දෙක හා නිලධාරි වාර්තාව අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීම) පිළිගන්නවා. අනෙක් කිසිම වරදක් කරලා නැහැ. අනෙක් වැරදි සියල්ලම ජංගම පරීක්ෂණ නිලධාරීන් විසින් මා සේවයෙන් ඉවත් කිරීම සඳහා නිර්මානය කරන ලද බොරු චෝදනා යනුවෙන් සාක්ෂිකරු ප්‍රකාශ කරයි.

හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ 2019.10.23 දින තමා අංක එන්. ඒ. 5194 බස් රථයේ සේවය කරමින් සිටියා. බස් රථය ගාල්ල සිට සිරිකඳුරවත්ත වත්ත දක්වා ගමන් කරමින් තිබියදී ප.ව 2.10 ට ජංගම පරීක්ෂණ නිලධාරීන් බස්රථයට නැංගා. එහිදී සිසුන්ගේ ප්‍රවේශ පත්‍ර ලබාගෙන පරීක්ෂණ කටයුතු කළ බව කියයි. ජංගම පරීක්ෂණ නිලධාරීන් විසින් සඳහන් කර ඇති වැරදි තමා විසින් නොකළ  බවත් කියයි. ධා 15 වාර්තාව අත්සන් කිරීම තමාගේ වරද පිළිගැනීමක් නොවන බව කොන්දොස්තරවරුන්ට දෙන උපදෙස් මාලාවේ සඳහන් බව දැන සිටියත් තමා එම වාර්ථාව අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරන ලද බවයි. එම ධා 15 වාර්තාව අත්සන් නොකිරීම බරපතල වරදක් බව ද චූදිත පිළිගනී. විනය පරීක්ෂණයේදී විත්තිය වෙනුවෙන් සාක්ෂි ලබා දීමට අවස්ථාව ලබා නොදුන් බවත් අත්සන් කිරීමට කියූ තැන්වල අත්සන් කළ බවත් කියයි. විනය පරීක්ෂණය සාධාරණ ලෙස පවත්වන ලද බවට චූදිත නිලධාරියා සහ ඔහුගේ නියෝජිත විසින් විනය පරීක්ෂණ සටහන්වල අවසන් පිටුවේ අත්සන් තබා ඇති බවද පළිගනී. කොන්දොස්තර උපදෙස් මාලාව සහ විනය ව්‍යවස්ථා මාලාව තමා නොදන්නා බවද ඔහු ප්‍රකාශ කරයි.

**2 පාර්ශ්වය වෙනුවෙන් ලබා දෙන ලද සාක්ෂි අංක 1**

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පළමු සාක්ෂිය ජංගම පරීක්ෂකවරයෙකු වන එම්. එස්. එම්. සෆ්රාස් විසින් ලබා දෙන ලදී.

මම 2019.10.23 දින රාජකාරියේ යෙදී සිටියේ තවත් ජංගම පරීක්ෂකවරුන් හතර දෙනෙකු සමග එකතුවයි. අපි කණ්ඩායම 2019.10.23 දින 14.10 පැයට වැල්ලබඩ කියන ගමන් අවස්ථාවෙදි එන්. වී. 5194 බස්රථයට ගොඩවී පරීක්ෂා කළා. පරීක්ෂාවේදී කන්තා ළමුන් දෙදෙනෙකුගෙන් රුපියල් 7.00 බැගින් රුපියල් 14.00 ක් ලබාගෙන ප්‍රවේශපත්‍ර ලබා දී තිබුනේ නැහැ. තවත් ළමුන් හත් දෙනෙකු ප්‍රවේශපත්‍ර නොමැතිව සිටි බවත්  ඔවුන් රුපියල් 50.00 ක් දී රු. 7.00 ප්‍රවේශපත්‍ර හතක් ඉල්ලා සිටියත් කොන්දොස්තර මහතා ඉතිරි රුපියල හා ප්‍රවේශපත්‍ර හත ලබා දී නොතිබුණි. එම ළමයින් ඒ ගැන ප්‍රකාශ ලබා දී ඇත. ඊට අමතරව නිකුත් කළ ප්‍රවේශපත්‍ර 23ක් කොන්දොස්තර මහතා අතෙහි තිබී සොයා ගෙන ඇත. ළමයින්ගෙන් ලබාගත් ප්‍රකාශවලට කොන්දොස්තර මහතාද අත්සන් කළ යුතු වුවත් ඔහු එය අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කර ඇත. කොන්දොස්තර මහතා අත තිබිය යුතු මුදල් පරීක්ෂා කිරිමේදී හෙලිවී ඇත්තේ රුපියල් 410.50 මුදලක් අඩුවෙන් තිබු බවයි. මෙම විමර්ෂණයට අදාළ සියලුම විස්තර ඇතුළත් කොට ජංගම පරීක්ෂණ නිලධාරින් විසින් සකස් කරන ධා 15 වාර්තාව අත්සන් කිරීම කොන්දොස්තර මහතා විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම ජංගම පරීක්ෂණ කණ්ඩායමේ නිලධාරීන් පස් දෙනෙකි. ජංගම පරීක්ෂණ නිලධාරින්ට මෙම කොන්දොස්තර මහතා හා රියදුරු මහතා මින් පෙර හමුවී නොමැති අතර මෙම රාජකාරියේ දී හමුවී ඇත්තේ පළමු වතාවටය.

හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කරන ලද්දේ කිසිවෙකුගේ උපදෙස් මත තකහනියේ මෙම බස් රථය පරීක්ෂාව සඳහා නොගිය බවයි. ධා 15 වාර්ථාවේ කොටස් දෙකක් ඇති බවත් මුලින් ඇති කොල දෙක මුලික වාර්ථාව බවත් ඉන් පසුව ලියා ඇති පිටු 16 විස්තර වාර්තාව බවත් ප්‍රකාශකරන ලදී. මුලික වාර්තාව පළමුව ලියන ලද බවත් විස්තර වාර්තාව පසුව ලියූ බවත් කියයි. පිටු අංක වෙනස් වීමට හේතුව එයයි.

**2 පාර්ශ්වය වෙනුවෙන් ලබා දෙන ලද සාක්ෂි අංක 2**

දෙවන පාර්ශ්වය වෙනුවෙන් මෙම සාක්ෂිය ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ විනය විභාග නිලධාරි එස්. ඩී. උපුල් චන්දන මහතා විසින් ලබා දෙන ලදී.

මෙම සිද්ධියට අදාළ විනය පරීක්ෂණය 2020.06.29 දින ගාල්ල ඩිපෝ විනය භාර නිලධාරි කාර්යාලයේ පවත් වන ලදී. මෙදින විත්තිකරුද ජංගම පරීක්ෂකවරුන් තුන් දෙනෙක්ද, රියදුරු මහතාද, විත්තිකරුගේ නියෝජිතයා වූ ජේ. පී. මැන්දිස් මහතා ද සහභාගි වන ලදී.

මුලින්ම ජංගම පරීක්ෂකවරුන් තුන් දෙනෙකුගේ සාක්ෂි ලබා ගත්තා. ඒ අවස්ථාවේදී චූදිතගේ නියෝජිත මහතා එකඟවුනා, ලබා දුන් සාක්ෂි වලින් පරීක්ෂණය අවසන් කරන්න. එයට එකඟව චූදිත සහ නියෝජිත අත්සන් තබා ඇත. චූදිත පක්ෂයට සාක්ෂි සඳහා අවස්ථාව ලබා දුන්නත්, චූදිත විසින් සාක්ෂි ලබා දීම සිදුකළේ නැහැ. සාක්ෂි ඉදිරිපත් නොකරන බවට අත්සන් කර තිබෙනවා. විභාගය පැවැත්වූ ආකාරය සතුටුදායක බවට ද චූදිත සහ නියෝජිත යන දෙදෙනාම වාර්ථාවේ අත්සන් තැබුවා. ඒ අනුව පරීක්ෂණ කටයුතු අවසන් කළා. විනය පරීක්ෂණයේ අවසන් නිගමනය වුනේ සියලුම චෝදනා වලට වරදකරු ලෙස තීරණය කිරීමයි. ඉල්ලුම්කරු බරපතල විෂමාචාරයක් සිදුකර ඇති බව අනාවරණය වුනා.

ලිඛිත දේශන (පළමු පාර්ශ්වය)

පළමු පාර්ශ්වයේ ස්ථාවරය වනුයේ ඔහු කිසිදු විෂමාචාරයක නොයෙදුනු බවත් ඔහු වරදකට පැටලැවීමේ ද්වේශ සහගත වුවමනාව මත මෙම විෂමාචාරය පිළිබඳ අසත්‍ය චෝදනාව නගන බවයි. ජංගම පරීක්ෂණ නිලධාරීන් මෙම බස්රථය පරීක්ෂා කිරීමට පෙර පරීක්ෂා කරන ලද බස්රථය පරීක්ෂණය අවසන් වී විනාඩි 15 ක් ඇතුලත කි. මී 10 දුර ගෙවා මෙම සේවකයා සිටි බස් රථයට ගොඩවී පරීක්ෂා කිරීම ඉලක්ක සහගත සැලැස්මක් බවද පෙන්වා දී ඇත. බස් රථය පරීක්ෂාවේදී සේවකයා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ගය ඉතාමත් අසාධාරණ හා අයුක්ති සහගත බවද කියයි. දුරකථන ඇමතුමක් ලබාගැනීමෙන් පසු අනුගමනය කළ ක්‍රියාමාර්ගය, විෂමාචාර ක්‍රියාව පිලිනොගැනීමෙන් පසු සේවකයා ධාවන කටයුතුවලින් ඉවත්ව තැබීම, චෝදනා පත්‍රයක් ලබාදීම සඳහා දීර්ඝ කාලයක් ගැනීම, එක් විනය නිලධාරිවරයෙකු විසින් පමණක් පරීක්ෂණය පැවැත්වීම, සේවකයා වෙනුවෙන් සාක්ෂි ලබා දීමට අවස්ථාවක් නොදීම හා විනය පරීක්ෂණය විධිමත් ලෙස නොපවත්වා ඉතා කෙටියෙන් අවසන් කිරීම, සේවකයා විසින් කරන ලද අභියාචනය පිළිබඳව සාධාරණ තීන්දුවක් ලබා නොදීම, යන කරුණු පෙන්වාදී ඇත.

සේවකයා වෙනුවෙන් ඉදිරිපත් වූ වෘත්තීය සමිති නියෝජිතවරයාද මෙම අවස්ථාවේ සාධාරණ පරීක්ෂණයක් සඳහා කටයුතු නොකරන ලද බවත් ඔහුද නිලධාරින් සමග වංක සහයෝගයෙන් කටයුතු කරන ලද බවත් එයින් නිලධාරියාට බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවත් කියයි. එක් චෝදනාවක් අනුව සේවකයා අත නියමිත මුදලට වඩා රුපියල් 410.50 ක් අඩුවෙන් තිබී ඇත. අනෙක් චෝදනාව අනුව මුදල් ලබාගෙන ටිකට් පත් නිකුත් කර නොමැත. මේ අනුව සිදු විය යුත්තේ මුදල් අඩුවෙන් තිබීම නොව වැඩියෙන් තිබීම විය යුතු බවට තර්ක කර සිටී. සේවකයාට වාසිදායක ලේඛන සැලකිල්ලට නොගැනීම, විනය පරීක්ෂණ නිලධරයා, එකවර කාර්යයන් දෙකක් සිදුකිරීම (එනම් පැමිණිල්ල මෙහෙයවීම හා විනය නිලධාරි වශයෙන් කටයුතු කිරීම) සේවකයාට එල්ල කරන ලද චෝදනා ඔප්පුකිරීම සඳහා බාහිර සාක්ෂි ලබා නොගැනීම. ජංගම පරීක්ෂකවරුන්ගේ සාක්ෂි හා වාර්තා මත පමණක් පදනම්ව නියෝගය ලබාදීම නිසා විනය පරීක්ෂණය මගින් සේවකයාට කිසිදු සහනයක් සිදුවී නොමැති බව ප්‍රකාශ කර සිටී.

ලිඛිත දේශන (දෙවැනි පාර්ශ්වය) දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වනුයේ කිසිදු ලෙසකින් අයුක්ති සහගත හා අසාධාරණ ලෙස සේවකයා සම්බන්ධයෙන් කටයුතු කර නොමැති අතර ද්වේශ සහගත ලෙස හෝ පලිගැනීමේ චේතනාවෙන් කටයුතු කර නොමැති බවයි. විනය ව්‍යවස්ථා මාලාවේ විධිවිධාන අනුව කරන ලද පරීක්ෂණය අනුව සොයාගත් කරුණු මත චෝදනා ගොනුකර ඇති බවත් ඒ චෝදනා පිළිබඳව විනය විභාගය සාධාරණව හා විධිමත්ව පවත්වන ලද බවත් චූදිතට තමන් වෙනුවෙන් සාක්ෂි ලබාදීමට අවස්ථාව ලබාදී ඇතත් ඔහු සාක්ෂි ලබාදී නොමැති බවත් එකී තීරණයට එරෙහිව අභියාචනයක් කිරීමේ අවස්ථාව ලබාදුන් බවත් අභියාචනයේ දී අභියාචක විසින් ඉදිරිපත් කරන ලද කරුණු මත සලකා බලා තීරණයක් ලබාදී ඇති බවත්ය.

සාක්ෂි විශ්ලේෂණය

පළමු පාර්ශ්වය මතු කරන වැදගත් කරුණක් වනුයේ මෙම චෝදනාවලට අදාළ කිසිදු වරදක් තමන් විසින් සිදු නොකරන ලද බවයි. පෞද්ගලික අමනාපකම් මත අභූත සහ අසත්‍ය චෝදනා නගමින් චෝදනා ඔප්පු කිරීමට නොහැකිව තිබියදී නිලධාරියා වරදකරු කර ඇති බවයි.

පළමු පාර්ශ්වය සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලද්දේ 2019.10.23 දින තමා අංක එන්.ජී. 5194 බස් රථයේ සේවය කරමින් සිටි බවත් බස් රථය ගාල්ල සිට සිරිකඳුරවත්ත වත්ත දක්වා ගමන් කරමින් තිබියදී ප.ව. 2.10ට ජංගම පරීක්ෂණ නිලධාරීන් බස්රථයට ගොඩවූ බවත්ය. තමා සියලුම මගීන්ට ටිකට් පත් ලබා දී තිබූ බව ඔහු කියයි. ජංගම පරීක්ෂණ නිලධාරීන් බස් රථයට නැග කිසිදු පරීක්ෂණයක් සිදුකළේ නැත. බස් රථයේ සිටි ශිෂ්‍යාවකගෙන් ටිකට් පත් 23ක් ලබාගෙන පරීක්ෂණ කටයුතු අවසන් කළ බව කියයි. ඉන් පසු වරද පළිගෙන ප්‍රකාශයක් ලබා දෙන ලෙස දන්වන ලද බවත් තමා කිසිවරදක් නොකළ බැවින් එයට එකඟ නොවූ බවත් කියයි. ඉන් පසු කිසියම් කෙනෙකුට දුරකථනයෙන් ඇමතුමක් ලබාගෙන එම අයගෙන් ලද උපදෙස් පරිදි තමාට එරෙහිව චෝදනා ගොඩනගා ඇති බව කියයි.

කෙනෙකු පිළිබඳව පෞද්ගලික අමනාපයක් ඇතිකර ගැනීමට පූර්ව හේතු තිබිය යුතුය. ජංගම පරීක්ෂණ කණ්ඩායමේ නිලධාරීන් පස් දෙනෙකි. එම ජංගම පරීක්ෂණ නිලධාරීන් හෝ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ වෙනත් නිලධාරීන් හෝ පැමිණිලිකරු සමග අමනාපයෙන් සිටි බවට කිසිදු හේතුවක් දක්වා නොමැත. ජංගම පරීක්ෂණ නිලධාරීන් හා පළමු පාර්ශ්වය හමුවූ මුල්ම දිනය බස් රථය පරීක්ෂා කළ දිනයයි. ජංගම පරීක්ෂණ නිලධාරීන් සාක්ෂි දෙන අවස්ථාවේ දී ප්‍රකාශ කරන ලද්දේ ද පළමු පාර්ශ්වය සමග කිසිදු අමනාපයක් නොමැති බවයි. ජංගම පරීක්ෂණ නිලධාරීන් විසින් බස් රථයක් පරීක්ෂා කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ගය විධිමත්ව අනුගමනය කර ඇතිබව පැහැදිලි කර ඇත. එහිදී ලිඛිත සාක්ෂි ලෙස මගීන්ගේ ප්‍රකාශ, අදාළ ටිකට් පත් හා ධා 15 වාර්තාව ඉදිරිපත්කර ඇත.

ඉහල නිලධාරියෙකුගේ උපදෙස් මත මෙම නිලධාරියාම අරමුණු කරගෙන විමර්ෂණ කටයුතු කරන ලද බව පැමිණිල්ල විසින් ප්‍රකාශ කරන නමුත් ඒ කරුණ සනාථ කිරීමට ප්‍රමාණවත් හේතු දක්වා නැත. මේ සියලු කරුණු සලකා බලා පෞද්ගලික අමනාපයක් මත අභූත චෝදනා නිලධාරියාට එරෙහිව ගොඩනගා ඇතැයි කරන ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමි.

විනය පරීක්ෂණය අවස්ථාවේදී තම අදහස් දැක්වීමට හෝ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට අවස්ථාවක් නොදුන් බවද පරීක්ෂණය අවසානයේදී අත්සන් කරන්නට කිවූ තැන්වල අත්සන පමණක් යොදන ලද බව ද පළමු පාර්ශ්වය කියා සිටී. එහෙත් පරීක්ෂණයේ සටහන් පරීක්ෂා කරන විට පෙනී යන්නේ පළමු පාර්ශ්වයේ නියෝජිත තැන සියලු සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න අසා ඇති බවත් පරීක්ෂණ සටහන් වල අවසන් පිටුවේ අත්සන් තබා ඇති බවයි. "විත්තියේ එකඟතාවය මත පැමිණිල්ලේ සාක්ෂි අවසන් කරමි." යනුවෙන්ද, "විත්තිය සාක්ෂි සඳහා කැඳවමි. විත්තිය සාක්ෂි ලබා නොදෙයි" යනුවෙන්ද, "විභාගය පැවැත්වූ ආකාරය සතුටුදායකයි" යනුවෙන්ද ස්ථාන තුනක යතුරුලියනය කර ඇති අතර ඒ ස්ථාන තුනෙහිම චූදිත නිලධාරියා සහ ඔහුගේ නියෝජිත අත්සන් තබා ඇත.

විනය පරීක්ෂණයේ දී, ඉදිරිපත් කරන ලද සාක්ෂි මගින් චෝදනා ඔප්පු කිරීමට පැමිණිල්ල අසමත්ව ඇති බවත් එසේ තිබියදී චූදිත වරදකරුවෙකු ලෙස තීරණය කොට දඬුවම් පමුණුවා ඇති බවටත් කරුණු දක්වයි. අදාළ බස්රථය පරීක්ෂණයට භාජනය කරන ලද ජංගම පරීක්ෂණ නිලධාරීන් පස් දෙනාගෙන් දෙදෙනෙකු විසින් සාක්ෂි ලබා දී ඇත. එම සාක්ෂි පරස්පරතාවකින් තොරව ඉදිරිපත් වී ඇති අතර අභියෝගයට ලක්වී නොමැත.

විනය පරීක්ෂණයේ දී චූදිතගේ පාර්ශ්වයෙන් සාක්ෂි ලබාදී නැත. චූදිත විසින් සාක්ෂි ලබාදී නොමැති අතර චූදිතගේ ලිඛිත ප්‍රකාශනයක් හෝ ලබාදී නොමැත. චූදිත නිලධරයා විනය පරීක්ෂණය අවස්ථාවේදී තමාට හිමි නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවන් ප්‍රයෝජනයට ගෙන නොමැති අතර විනය පරීක්ෂණය නිසි ලෙස පවත්වා නැතැයි පසුව ප්‍රකාශ කිරීම පිළිගත නොහැක.

සේවකයා වෙනුවෙන් ඉදිරිපත්වූ වෘත්තීය සමිති නියෝජිතයා සාධාරණ පරීක්ෂණයක් සඳහා කටයුතු නොකරන ලද බවත්, ඔවුන් නිලධාරීන් සමග වංක සහයෝගයෙන් කටයුතු කරන ලද බවත් කියා ඇත. නමුත් චූදිත විසින් අභියාචනා පරීක්ෂණය සඳහා තම නියෝජිතයා වශයෙන් තෝරා ගෙන ඇත්තේද විනය පරීක්ෂණයේදී තමා වෙනුවෙන් පෙනී සිටි එම වෘත්තීය සමිති නියෝජිතයාමය. වෙනත් නියෝජිතයෙකු තෝරාගත හැකිව තිබිය දී නිලධාරීන් සමග වංක සහයෝගයෙන් කටයුතු කළේයැයි චෝදනා එල්ල කරන එකී නියෝජිතයාම අභියාචනා පරීක්ෂණ සඳහා ද තෝරාගත්තේ කුමන හේතුවක් මතදැයි මට පැහැදිලි නොවේ.

පළමු පාර්ශ්වය තමාට එරෙහිව පවත්වන ලද විනය විභාගයෙන් සියලු චෝදනා වලට වරදකරු බවට තීරණය කර දඬුවම් නියම කිරීමෙන් පසු අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අභියාචන අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී අභියාචනා පරීක්ෂණ නිලධාරීන් විසින් සැලකිල්ලට ගතයුතු සුවිශේෂ නීතිමය හා සිද්ධිමය කරුණු ඉදිරිපත් කරන ලද්දේද යන්න පිළිබඳව සාක්ෂි ඉදිරිපත් නොකරන ලදී. පළමු පාර්ශ්වය ප්‍රකාශකරනුයේ අභියාචනා පරීක්ෂණය සඳහා අදහස් ඉදිරිපත් කිරීමට තමන්ට අවස්ථාවක් නොදුන් බවයි. තමන්ට අත්සන් කිරීමට පෙන්වූ තැන්වල අත්සන් කළා පමණක් බව කියා සිටී. අභියාචනා පරීක්ෂණය සාධාරණ ලෙස සිදු නොවූයේ නම් පළමු පාර්ශ්වය සහ ඔහුගේ නියෝජිතයා එම පරීක්ෂණ වාර්තාවට කිසිදු විරෝධයක් නොදක්වා අත්සන් කළේ ඇයි දැයි පෙන්වාදී නැත.

මේ සියලු කරුණු සලකා බලා මෙම පරීක්ෂණයේ පළමු පාර්ශ්වය වන ඩී. එච්. ටී. සෙනරත් මහතාට 2020.02.13 දින වැඩ තහනම් කරමින් ලබාදී ඇති විනය දඬුවම් මගින් අසාධාරණයක් සිදුවී නැති බව තීරණය කරමි.

මේ අනුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් යොමුකරන ලද විසඳිය යුතු ප්‍රශ්න සම්බන්ධයෙන් පිළිතුරු පහත පරිදිවේ.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ඩී. එච්. ටී. සෙනවිරත් මහතාට

(1) 2020.02.13 දින වැඩ තහනම් කරමින් ලබාදී ඇති විනය දඬුවම් (අත්හිටවූ කාලයට හිග වැටුප්, අනෙකුත් දීමනා සියල්ල වර්ෂ අවසානයේ ලබාදෙන බෝනස් දීමනා, අර්ථ සාධක අරමුදල් හා වෙනත් සහනයන් ලබා නොදීම) මගින් අසාධාරණයක් සිදුව තිබේද?

පිළිතුර - නැත

(2) එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද ?

පිළිතුර - අදාළ නොවේ.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

**නීතිඥ ආර්. ඒ. තිලකරත්න,**
බේරුම්කරු.

2024 මැයි මස 25 වැනි දින.

EOG 07 - 0066

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.